# 2017 සැප්තැම්බර් මස සාංඝික පවුල් දින සුපුවත
# අප දේශය වෙනුවෙන් දෙවියන් වහන්සේ
# ඉදිරියේ මැදිහත්වීමේ දිනය

තේමාව - 2 වංශාවලිය 7:14

**"මාගේ නාමය දරණ මාගේ සෙනඟ බැගෑපත් වී, යාච්ඤා කර, මා සොයා තමන්ගේ නපුරු මාර්ග අතහැරියොත්, මම ස්වර්ගයේ සිට එය අසා, ඔවුන්ගේ පව් කමා කොට ඔවුන්ගේ දේශයට සෙත සලසන්නෙමි."**

හැඳින්වීම :

සැප්තැම්බර් මස පළමුවන ඉරුදින දේශය වෙනුවෙන් දෙවිඳුන් ඉදිරියෙහි මැදිහත්වීමේ දිනය ලෙස අපගේ වාර්ෂික කාලසටහනට එක්වී හමාර ය. 2014, 2015 සහ 2016 යන වසරයන්හි රටේ ඒ ඒ අවස්ථාවන්හි පැවති තත්ත්වයන් ඉදිරියෙහි අප බැගෑපත්ව දෙවිඳුන් ඉදිරියට පැමිණියෙමු. ඔවුන් වහන්සේද අපගේ කන්නලව් වලට ප්‍රාතිහාරාත්මකව සවන් දුන් සේක. ඒ සියල්ල සිහිපත් කරමින් අපි දෙවිඳුන්ට ප්‍රශංසා කරමු.

දවසේ සුපුවත: (පණිවුඩය)

අද අපි ඒකරාශි වී සිටින්නේ දේශය උදෙසා දෙවිඳුන් ඉදිරියේ මැදිහත් වීමටය. එසේ නම් මැදිහත්කරුවා යනු කව්දැයි ශු.බයිබලීය ඉගැන්වීම් දෙසට අප විවෘත විය යුතුය. මැදිහත්කරුවා සෑම විටම තව කෙනෙක් වෙනුවෙන් දෙවිඳුන් ඉදිරියේ පෙනී සිටින්නෙකි. මැදිහත්වීමේ යාච්ඤාව තමන් වෙනුවෙන්ම කෙනෙක් කරන්නාවූ යාච්ඤාව අභිබවා යයි. එය දෙවියන් වහන්සේගේ ගැළවීමේ සැලැස්මට සම්බන්ධය. මැදිහත්වීම යනු දෙවියන් වහන්සේගේ දූත කාර්යය සඳහා මනුෂ්‍ය - දේව සබඳතාවයකට ඇතුළත් වීමකි. එහි අවකාශය ඉතාම පුළුල්ය. මැදිහත්වීමේ සැබෑ ලක්ෂණය නම් අප යාච්ඤා කරන කෙනාගේ හෝ දෙය පිළිබඳව සම්පූර්ණ බර, එසේත් නැත්නම් වේදනාව අපගේ කර පිටට ගැනීමය.

අප ශුද්ධවර ජුවාම් තුමාගේ සුවිශේෂයේ සඳහන් ඉතාමත් වැදගත් සිද්ධියක් කෙරෙහි අපගේ අවධානය යොමු කරමු.

**"ජේසුස් වහන්සේ, ඈ ද ඈ සමඟ ආ ජුදෙව්වරුන් ද හඬනු දැක, සිතින් සුසුම්ලා කැළඹී, ඔහු කොතැන තැන්පත් කළාහුදැ"යි ඇසූ සේක."** (ශු.ජොහාන් 11:33)

**" ජේසුස් වහන්සේ හැඬූ සේක"** (ශු.ජොහාන් 11:35)

**"එවිට නැවතත් ජේසුස් වහන්සේ අතිශයින් කැළඹී, සොහොන් ගේ ළඟට පැමිණි සේක. එය වනාහි ගල් ගුහාවකි. එහි කට ගලකින් වසා තිබුණි. ගල ඉවත් කරන්නැයි ජේසුස් වහන්සේ වදාළ සේක."** (ශු.ජොහාන් 11:38)

ක්‍රිස්තුන් වහන්සේගේ හදවතට ඇතුළත් වී දේශය උදෙසා අපට යාච්ඤා කළ හැකි නම් සැබවින්ම දෙවිඳාණෝ අපගේ යාච්ඤාවලට, කන්නලව් වලට සවන් දී ප්‍රාතිහාර්යන් ඉටු කරනු ඇත.

අපි උදාහරණ කීපයක් දෙස බලමු.

(අ) ඩෙංගු වසංගතය :

ඩෙංගු වසංගතය නිසා කොපමණ ජනතාවක් අපගේ දේශය තුළ මිය යනවාද? ගැබිනි මව්වරු, කුඩා දරුවන්, දෙමව්පියන්, සමහර විට එකම පවුලේ කීප දෙනෙක්, ඔවුන්ගේ අඳෝනාව, ඇඬීම, දුක වේදනාව අපට ඇසෙනවාද? දැනෙනවා ද? මාව අපව අඬවන්නට තරම් ඒ වේදනාව දැනෙනවාද?

(ආ) වෛද්‍ය වරුන්ගේ වැඩ වර්ජන:

අද රෝහල් කරා ප්‍රතිකාර සඳහා වැඩියෙන්ම ඇදී යන්නේ කව්රුද? සමාජයේ අන්තිම දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාවය. මෙම වැඩ වර්ජන නිසා සිදුවනුයේ කුමක්ද? දරිද්‍රතාවයෙන් පෙලෙන "දරිද්‍රයා" අප තව තවත් දරිද්‍රතාවය කරා ඇද දමනවා නොවේද? උදේ පාන්දරින් නැගිට, රෝහල් කරා පැමිණ පැය ගණනාවක් වෛද්‍යවරුන් එන තෙක් බලා සිට හැරී යන්නට සිදුවන අසරණ රෝගීන්ගේ අඳෝනාව, කන්නලව්ව, දුක, වේදනාව අපට ඇසෙනවාද? දැනෙනවාද? පෙනෙනවාද? ක්‍රිස්තුන් වහන්සේට හඬන්නට තරම් දැනුනු වේදනාව අපට දැනෙනවාද? එසේ නම් අපගේ යාච්ඤාවට දෙවිඳාණෝ සවන් දෙනු ඇත.

(ඇ) කුණු කන්දක් පෙරලී අසරණයන් මරණයට පත් වීම :

ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන් පවා අහිමි වීම. ඔවුන්ගේ දුක වේදනාව අපට දැනෙනවාද? "ක්‍රිස්තුන් වහන්සේ ඇඬූ සේක" අපව අඬවන්නට තරම් මෙම සිද්ධීන් අපව කම්පනයට පත් කොට ඇත්ද? එසේ නම් දෙවිඳාණෝ අපගේ යාච්ඤාවලට සවන් දෙනු ඇත.

අප දේශයේ දුක් ගාවිනාවන්හි උදාහරණ ස්වල්පයක් පමණකි අප බෙදා ගත්තේ. අපගේ යාච්ඤාවනට දෙවිඳුන්ගේ දෙසවන් යොමු වීමේ රහස නම් අප ක්‍රිස්තුන් වහන්සේගේ හදවතට ඇතුළු වීමයි.

* මනුෂ්‍ය දුක වේදනාව ඉදිරියේ අප සමිඳාණෝ කම්පා වූ සේක.
* මනුෂ්‍යයාගේ දුක තමන්ගේම දුක බවට පත්කර ගත් සේක.
* මනුෂ්‍යයා සමඟම හැඬූ සේක.
* එයින් නතර වූයේ නැත. මෙම දුකෙන් මනුෂ්‍යයා මුදවා ගැනීම සඳහා ගතහැකි සෑම පියවරක්ම ගත් සේක.

1. කට වසා තිබූ ගල් ගුහාව ළඟට වැඩම කළ සේක.
2. එම කලු ගල කෙතරම් විශාල වුවද, එය පෙරලා දැමීමට පියවර ගත් සේක.
3. දින හතරක් වලදා සිටින මිනිසකුගේ මෘතදේහය පනුවෝ ගසා ගඳ ගසනු නිසැකය. එවැනි කෙනෙකුට ප්‍රාණය දෙන්නේ කෙසේද? ඉතිහාසය පුරා එසේ සිදුවී නොමැත. එහෙත් දෙවියන් වහන්සේට සියල්ල කළහැකි බව ක්‍රිස්තුන් වහන්සේ ස්ථිරව විශ්වාස කළ සේක. තමන් නිසලව හඬමින් කළ යාච්ඤාවට දෙවිඳාණෝ දැනටමත් සවන් දී අවසාන බව විශ්වාස කළා පමණක් නොව, එය සියල්ලන්ට ඇසෙන සේ ප්‍රකාශ කළ සේක. දෙවියන් වහන්සේට ස්තුති කළ සේක.

කණ්ඩායම් සාකච්ඡාව:

මෙම සිද්ධිය ඉදිරියේ ක්‍රිස්තුන් වහන්සේ මැදිහත් කරුවකු වූයේ කෙසේදැයි බෙදා ගන්න. මැදිහත්කරුවෙකු ලෙස ක්‍රිස්තුන් වහන්සේ තුළ තිබූ ප්‍රධානම ලක්ෂණ මොනවාද?

කණ්ඩායම් සාකච්ඡාවෙන් පසු වචනයේ සේවකයා ජනතාවට කුඩා අතදීමක් දෙන්න.

1. ක්‍රිස්තුන් වහන්සේ ඇඬුවා. කැළඹුනා. සිද්ධයට පෞද්ගලිකව සංවේදී වූවා.
2. අන් අයවද හවුල් කර ගත්තා. ගල පෙරලන්න උදව් ගත්තා.
3. දෙවියන් වහන්සේ කෙරෙහි පූර්ණව විශ්වාස කළා. දෙවියන් වහන්සේට සියල්ල කළහැකි බවට, තමන්ගේ යාච්ඤාවට සවන් දී අවසාන බව, ලාසරස් මරණයෙන් නැඟිට අවසාන බව චිත්‍රගත කර ගත්තා. විශ්වාසය ශබ්ද නගා ප්‍රකාශ කළා.

ඔටුනු පැළඳූ ක්‍රිස්තුන් වහන්සේ මැදිහත් කරුවාණන් ලෙස ඔවුන් වහන්සේ වෙත දැඩි උවමනාවෙන් බලමු.

කතෝලික සභා ධර්මෝපදේශය මැදිහත් වීම ගැන අපට මෙලෙස උගන්වන්නීය.

"මැදිහත්වීම යනු ජේසුස් වහන්සේ යාච්ඤා කළ ආකාරයට යාච්ඤා කිරීමට අප පොළඹවන අයැදීමේ යාච්ඤාවකි. පියාණන් වහන්සේ ඉදිරියෙහි සියළු මනුෂ්‍යයන් වෙනුවෙන් විශේෂයෙන් පව්කාරයන් වෙනුවෙන් මැදිහත්වන එකම මැදිහත්කරුවාණෝ ජේසුස් වහන්සේ වනසේක." (CCC 2634) මෙලොව මනුෂ්‍යාකාරයෙන් ජීවත් වෙද්දී ජේසුස් වහන්සේ සියල්ලන් උදෙසා මැදිහත් වූ සේක. මැදිහත්වීමේ සේවාව ඔවුන් වහන්සේ ආරම්භ කළේ ජෝර්දාන් නදියේ බෞතිස්ම ස්නාපනය ලැබීමත් සමඟම පාළුකරයේ දින 40ක් පුරා යාච්ඤා කිරීම තුළින්ය. යාච්ඤාවෙන් ආරම්භ කළ සමිඳාණන් වහන්සේගේ ජීවිතය යාච්ඤාවෙන්ම පෙඟුනාසේය. ගෝලයන් 12 තෝරා ගැනීමට පෙර සමිඳාණෝ මුළු රාත්‍රිය පුරාම දේව තාත්තා ඉදිරියේ මැදිහත් වූ සේක. තිරිඟු පොළොන්නාක් මෙන් ගෝලයන්ව පොළන්නට සාතන් අවසර ලබා ඇති බව සීමොන් පේදුරුට අනතුරු ඇඟවූ සමිඳාණෝ මා සාතන්ව නවත්වන්නම් එසේත් නැත්නම් පලවා හරින්නම් යනුවෙන් පැවසුවේ නැත.

**"ඔබේ ඇදහිල්ල නොබිඳෙන පිණිස ඔබ උදෙසා මම යාච්ඤා කළෙමි"** (ශු.ලූක් 22:32) සුවිශේෂය පුරාම මෙලෙස ක්‍රිස්තුන් වහන්සේගේ මැදිහත්වීම අපට දැකගත හැකිය.

ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීමේ සේවාව, සුව සේවාව, යකුන් දුරු කිරීමේ සේවාව ගැන අප නිතර කථා කරන්නෙමු.

**"එහෙත් දැන් ඔවුන් වහන්සේ වඩා උතුම් පොරොන්දු පිට පිහිටුවන ලද වඩා විශිෂ්ඨ ගිවිසුමක මැදහත්කාරයාණන්ව සිටින සේම ඔවුන් වහන්සේ වඩා උතුම් සේවක ධූරයක් ලැබූ සේක."** (හෙබ්‍රෙව් 8:6)

අද දින මෙම දේව වචනය කෙරෙහි අපගේ සිත් සතන් යොමු කළ යුතුය. ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේ මෙන්ම පූර්ණ මනුෂ්‍යයාද වූ සේක. එම නිසා මනුෂ්‍ය දුබලකම්, බැරිකම් ඔවුන් වහන්සේ හොඳින් දන්නා සේක. මෙම ස්වභාවයන් දෙකෙහිම පංගුකාරයන් වීම හේතු කොටගෙන මනුෂ්‍යයා හා දෙවියන් වහන්සේ අතර මැදිහත්කාරකමේ සුදුසුම තැනැත්තා ඔවුන් වහන්සේමය.

**"ඇත්තේ එකම දෙවියන් වහන්සේය. දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයන් අතර වනුයේ එකම මැදහත්කාකරයෙකි. එනම් මනුෂ්‍යයෙකු වූ ජේසුස් වහන්සේය. සියල්ලන්ගේ මිදීම පිණිස ඔවුන් වහන්සේ සිය දිවි පිදූ සේක."** (1තිමෝති 2:5,6)

ක්‍රිස්තුන් වහන්සේගේ මැදිහත්වීමේ උච්චතම අවස්ථාව කුරුස ගසයි. කුරුස ගසින් ඔවුන් වහන්සේගේ මැදිහත්වීම අවසන් වූයේ නැත. ඔවුන් වහන්සේගේ මරණයත් උත්ථානයත් දෙවි පියාණන්ගේ දකුණු පසෙහි සිටිමින්ද, අද වනතුරුත් ක්‍රිස්තුන් වහන්සේ අප උදෙසා මැදිහත් වන සේක.

**"අප උදෙසා මැරුණේත්, අප උදෙසා මරණයෙටන් උත්ථාන වූයේත් ක්‍රිස්තුන් ජේසුස් වහන්සේය. දෙවියන් වහන්සේගේ දකුණු පස වැඩ සිටිමින් අප වෙනුවෙන් මැදහත් වන්නේත් ඔවුන් වහන්සේය."** (රෝම 8:34)

**"එබැවින් ඔවුන් වහන්සේ මගින් දෙවියන් වහන්සේ වෙතට ළඟා වන්නන් සදහටම ගළවගන්නට ඔවුන් වහන්සේට පිළිවන. මන්ද, ඔවුන් උදෙසා මැදහත් වීමට ඔවුන් වහන්සේ සදහටම ජීවත් වන බැවිනි."** (හෙබ්‍රෙව් 7:25)

මේ අනුව අද දින අප සුවිශේෂ ලෙස සිහි තබා ගතයුතු සත්‍යතාවයක් නම්, ක්‍රිස්තුන් වහන්සේගේ සිතෙහි සියළු සේවාවන් අතර මැදිහත්වීමේ සේවාව සඳහා සුවිශේෂ ස්ථානයක් අදත්, සදහටමත් තිබෙන බවය.

අද දවසේ වචනය අවසන් කිරීම සඳහා අප මුලින්ම ඔබට මතක් කර දුන් සභා ඉගැන්වීම වෙත නැවතත් රැගෙන යාමට කැමැත්තෙමු. එනම් :

පිටුව 654 - 2634

"මැදිහත්වීම යනු ජේසුස් වහන්සේ යාච්ඤා කළ ආකාරයට යාච්ඤා කිරීමට අප පොළඹවන අයැදීමේ යාච්ඤාවකි. විශේෂයෙන්ම පව්කාරයන් වෙනුවෙන් මැදිහත් වන එකම මැදිහත්කරුවාණන් ජේසුස් වහන්සේ වන සේක. එබැවින් ඔවුන් වහන්සේ මගින් දෙවියන් වහන්සේ වෙත ළඟා වන්නන් සදහටම ගළවන්නට ඔවුන් වහන්සේ සදාකල්හිම වැඩ සිටින බැවිනි. එලෙස ශුද්ධාත්මයාණන් වහන්සේම අපගේ දුර්වලකම් වලදී අපට ආධාර දෙන සේක. ශුද්ධාත්මයාණන් වහන්සේම අප උදෙසා මැදිහත් වන සේක. එලෙසම දෙවියන් වහන්සේගේ කැමැත්ත ලෙස සියලු සැදැහැවතුන් වෙනුවෙන් මැදහත් වන සේක."